# ප්‍රධාන ලේකම් කාර්යාලය - දකුණු පළාත
## பிரதான செயலாளர் அலுவலகம் - தென் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - SOUTHERN PROVINCE


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | CSS/7/5/6/1 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2017.03.27 |

**ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 03 -2017**

දකුණු පළාතේ සියළුම<br>
ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන්,<br>
ගණන් දීමේ නිලධාරීන් හා<br>
ආදායම් ගණන් දීමේ නිලධාරීන් වෙත.

<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්</u>

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් මාගේ සමාංක හා 2015.06.29 දිනැති ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි(මුදල්) 04-2015 හා 2016.01.28 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(I)(i) ලිපිය හා බැඳේ.

02.ප්‍රධාන ලේකම් උපදෙස් ලිපි (මුදල්) 04-2015 මඟින් පෙන්වා දී ඇති පරිදි ඔබ අමාත්‍යාංශයට/ දෙපාර්තමේන්තුවට අයත් ආයතන සම්බන්ධයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කාර්තුවකට එක් වරක්වත් අනිවාර්යයෙන් පැවැත්විය යුතු වුවද, පළාත් සභාවේ වැය ශීර්ෂයන් යටතේ පාලනය වන සමහර අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත අධිකාරී ආයතන විසින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තවමත් නියමාකාරයෙන් නොපවත්වන බවට වාර්තා වී ඇත.දකුණු පළාත් අරමුදල් හා ගිණුම් පිළිබඳ කාරක සභාවේ මෙන්ම පාර්ලිමේන්තු රාජ්‍ය ගිණුම් කාරක සභාවේදීද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් නියමිත පරිදි පැවැත්වීමේ අවශ්‍යතාවය නිරන්තරයෙන් පෙන්වා දී ඇත.

03. 2016.01.28 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(I)(i) අනුව අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2009.06.09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009/(I) හි 06 වන කරුණට අදාළ අවසාන ඡේදය පහත පරිදි සංශෝධනය කර ඇත.

**04.විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේදී ආයතන ප්‍රධානියා ආදායම් ගණන් දීමේ නිලධාරියා වන දෙපාර්තමේන්තු සෑම මාස 02 කට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 06ක්ද අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කාර්තුවකට අවම වශයෙන් එක් රැස්වීම බැගින් රැස්වීම් 04 ක්ද පැවැත්විය යුතුය.**

05.අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු සඳහා සහභාගී කර ගැනීම මගින් මෙම කමිටුවේදී ගනු ලබන නිවාරණ තීරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවකාශ සලසා ගත හැකි බව වැඩිදුරටත් සඳහන් වේ.


ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary 091 2232343 | කාර්යාලය / காரியாலயம் / Office 091 2234052, 091 2226118 | ෆැක්ස් / பெக்ஸ் / Fax 091 2246299 | විද්‍යුත් තැපෑල / மின் அஞ்சல் / E-mail chiefsec1@sltnet.lk | වෙබ් අඩවිය / இ தளம் / Web site www.cs.sp.gov.lk

ප්‍රධාන ලේකම් කාර්යාලය, එස්.එච්. දහනායක මාවත, ගාල්ල. Chief Secretary's Office, S.H. Dahanayaka Mawatha, Galle.

பிரதான செயலாளர் காரியாலயம், எஸ்.எச்.தஹநாயக மாவத்தை, காலி.


"විශිෂ්ටත්වයෙන් ① ට එන යහපාලනයක්"

06.එසේම එම චක්‍රලේඛය මගින් හඳුන්වාදී ඇති විගණන හා කළමනාකරණ කමිටුවේ විමර්ශනයට ලක්විය යුතු කරුණු පහත පරිදි වේ. ඒ අතුරින් ඔබ ආයතනයට අදාළ වන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

1.අභ්‍යන්තර විගණන ඒකකයේ විෂය පථය නිර්ණය කිරීම.

2.වාර්ෂික විගණන සැලැස්ම සහ වැඩසටහන අනුමත කර ගැනීම සහ පූර්වදර්ශනය කිරීම.බාහිර විගණක/විගණකාධිපති උපදෙස් අනුව අභ්‍යන්තර විගණක විසින් වාර්ෂික විගණන සැලැස්ම සකස් කල යුතුය.

3.අභ්‍යන්තර විගණන වාර්තා මත පදනම් වූ ගිණුම්කරණ, මූල්‍ය හා මෙහෙයුම් අංශයන්ගෙන් ආවරණය වන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් අගය කිරීම සහ සමාලෝචනය කිරීම.

4.නැවත සිදුවීම වැලැක්වීම සඳහා අභ්‍යන්තර විගණක වාර්තා සමාලෝචනය කර නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ.

5.අයවැය, සමාලෝචිත වාර්තා සහ පිරිවැය ඵලදායීතාවය ගණනය කිරීම, කාර්යසාධනය සහ අරමුණු හඳුනාගැනීම ඇතුළත් ප්‍රාථමික අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.

6.වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රමිත වල අනුකූලතාව සමාලෝචනය කිරීම.

7.අවසාන ගිණුම්,වාර්ෂික වාර්තා ආදිය නියමිත දිනට ඉදිරිපත් කිරීම සහතික කිරීම.

8.අභ්‍යන්තර විගණකවරුන් සහ බාහිර විගණකවරුන් අතර මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.

9.ඉහළ කළමනාකාරීත්වය ව්‍යවස්ථාපිත හා අනෙකුත් නීති සහ රෙගුලාසි පිළිබඳ හොඳින් දන්නා බවට සහතික වීම.

10.භාණ්ඩාගාර චක්‍රලේඛ සහ අනෙකුත් නියෝගයන්ගේ අනුකූලතාවය පිළිබඳ අවශ්‍යතාවයෙහි දැනුවත් බව.

11.සියලු මානව සම්පත් සහ අනෙකුත් සම්පත් සංවර්ධන ගැටලු පිළිබඳ සමාලෝචනය කිරීම සහ තීරණ ගැනීම සඳහා වාර්තා ඉදිරිපත් කිරීම.

12.සේවක විනය,නාස්තිය හා දූෂණය ඉවත් කිරීම,සංවිධානයේ පිරිවැය ආදියේ පවතින ගැටලු පිළිබඳ සමාලෝචනය කිරීම.

13.ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීති හා රෙගුලාසි වල අනුකූලතාව පිළිබඳ සමාලෝචනය කිරීම.

14.අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ කෙටිකාලීනව ඇතිවන ගැටලු සඳහා නියමිත ක්‍රියාමාර්ග ගන්නා බවට සහතික වීම.

15.රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සහ රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ සමාලෝචනය කිරීම.

16.අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අමාත්‍යාංශ ලේකම්ට නිර්දේශවල සාරාංශයන්(රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ කමිටුව)ඉදිරිපත් කිරීම.

17.කමිටුවේ නිර්දේශයන් පදනම් කරගෙන තීරණ මෙහෙයවීම.

18.වාර්ෂික වාර්තා/පරිපාලන වාර්තා වල අන්තර්ගත කිරීම සඳහා කමිටුවේ කාර්යසාධනය පිළිබඳ වාර්තා ඉදිරිපත් කිරීම.

19.වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම,ක්‍රියාකාරී සැලැස්ම, සංයුක්ත සැලැස්ම සමාලෝචනය කිරීම.

07.ඒ අනුව ඉහත උපදෙස් පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා අප්‍රමාදව එහි වාර්තා පිටපත් සහභාගී වූ සියලු නිලධාරීන්ට, සහකාර විගණකාධිපති දෙපාර්තමේන්තුවට, පළාත් භාණ්ඩාගාරයේ මුදල් දෙපාර්තමේන්තුවට හා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

08.මෙසේ විගණන හා කළමනාකරණ කමිටු විධිමත්ව පත් කර නියමිත පරිදි රැස්වීම් පවත්වා,ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීමෙන් ඔබ ආයතනයේ හා ඔබ යටතේ පාලනය වන ආයතන වල කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීමටත්, යහපත් පරිපාලන හා මූල්‍ය විනයක් පවත්වාගෙන යාමටත් හේතුවන බව නැවතත් අවධාරණය කරමි.

ආර්.සී.ද සොයිසා
ප්‍රධාන ලේකම්,
දකුණු පළාත.

පිටපත් : 01. සහකාර විගණකාධිපති, දකුණු පළාත : දැ.ගැ.ස.
02. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, දකුණු පළාත් සභාව : දැ.ගැ.ස.

# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
# முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
# DEPARTMENT OF MANAGEMENT AUDIT

| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு, | Ministry of Finance |
| මහලේකම් කාර්යාලය, කොළඹ-01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01 |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DMA/cir -edit/2016 | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date: 2016.01. |

කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/2009 (I) (i)

අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

## <u>අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ</u>

ඉහත කරුණට අදාලව නිකුත් කර ඇති 2009.06.09 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ DMA/2009 (I) දරණ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කරවමි. එකී චක්‍රලේඛයේ 06 වන කරුණට අදාල අවසාන ඡේදය පහත පරිදි සංශෝධනය කරනු ලබන අතර එය 2016.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක වේ.

02. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමේදී ආයතන ප්‍රධානියා ආදායම් ගණන් දීමේ නිලධාරියා වන දෙපාර්තමේන්තු සෑම මාස 02 කට වරක් බැගින් වර්ෂයකට රැස්වීම් 06 ක්ද අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු කාර්තුවකට අවම වශයෙන් එක් රැස්වීම බැගින් රැස්වීම් 04 ක්ද පැවැත්විය යුතු වේ. අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තු වල ප්‍රධානීන් අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු සඳහා සහභාගී කර ගැනීම මගින් මෙම කමිටුවේදී ගනු ලබන නිවාරණ තිරණ කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවකාශ සලසා ගත හැකිය. විගණන හා කළමනාකරණ කමිටු සඳහා යෝජිත කාර්ය නිර්දේශයන් ඇමුණුම 01 හි සඳහන් වේ.

මෙයට -විශ්වාසී,

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව

පිටපත - විගණකාධිපති


| | | | |
|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600, 2484700 | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: (9411)2484543 | ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496 | වෙබ් අඩවිය / வெப் தளம் / website: www. treasury .gov.lk |